## 184 දෙව් සමිඳුන් අප හට දුන් තිළිණයකි

දෙව් සමිඳුන් අප හට දුන් තිළිණයකි මේ ජීවිතේ
අප හැකිකම් අප සූරුකම් පිණිසැ යොදවමු ජන සේවේ
ලද උපතින් කුසලතාවන් නොදෙමු යන්නට අපතේ //
දෙව් මහිමය හා සත සෙත උදෙසා
වැයවෙමු වැයවෙමූ ඒ යුතුකමයැ අපේ

පුතු දෙවිඳුන් දිවිය පුද දුන්
මිනිසි වග වෙතැ මෙත පා //
අප හට පෑ මගැ පියවර තබමින්
කැපවෙමු කැපවෙමු හිත සුව පිණිසැ ලොවේ

දෑ අබිමන් නිතොර වඩමින්
සිරුරු දහදිය වගුරා
දෙස රැස හා බස දියුණුව සඳහා
වෙහෙසෙමු වෙහෙසෙමු
සුව පහසුව නොතකා